**ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරණ ව්‍යාපෘතිය - 2018**

---

ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරණ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 සැප්තැම්බර් 29 දින එළඹි අංක 5788 - එල්කේ දරණ ණය ගිවිසුමේ පොදු කොන්දේසිවල ඇතුලත් II බී (3) වගන්තිය සහ 4.09 (බී) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘති ණය ගිවිසුමට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග සහ මාර්ග සංවර්ධන සහ ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ වත්කම් කලමනාකරණය පිලිබඳ මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතාව ශක්තිමත් කිරීම සහ ඵලදායීථාවය හා කාර්යසාධනය පාදක මාර්ග කොන්ත්‍රාත්තු ආකෘතිය භාවිතා කරමින් ප්‍රමුඛ ව්‍යාපෘතියක් ලෙස පෑලියගොඩ - පුත්තලම මාර්ගයේ ජා-ඇල සිට හලාවත දක්වා කි.මී. 58 කින් යුත් (කොටසක්) දුර ප්‍රමාණයක් සැලසුම් කිරීම, ඉදිකිරීම, නඩත්තු කිරීමේ ගිවිසුමක් ලෙස ක්‍රියාත්මක කිරීමයි. වත්කම් කළමනාකරණය සඳහා ආයතනික ශක්තිමත් කිරීම සහ ධාරිතා වර්ධනය යන සංරචක යටතේ ව්‍යාපාතියේ කටයුතු ක්‍රියාත්මක කරයි. ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 18,125 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 125 ක් (වි:ගැ:හි 90.5) වූ අතර සම්පූරණ වටිනාකමම මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟවී තිබුණි.කෙසේ වෙතත් 2018 අගෝස්තු 15 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයකට අනුව ව්‍යාපෘතියේ මූලික විෂය පථය වෙනස්කර තිබුණි. රු. මි. 14,500 කට සමාන එ.ජ ඩොලර් මිලියන 100 ක මූලික ණය ප්‍රතිපාදනයෙන් සිදු කිරීමට තිබූ වැඩ ඉවත්කර තිබුනි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජුනි 30 දින ආරම්භ කර තිබුණු අතර 2018 අගෝස්තු 15 දින ප්‍රතිව්‍යුහගත කර තිබුණු අතර එසේම, සහ 2026 ජුනි 30 වන විට අවසන් කිරීමට අපේක්ෂිතය.

**1.3 මතය**

---

මාගේ මතය,ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනයන් තුළින් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවයි.

**1.4 මතය සඳහා පදනම**

---

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම පාලනය සම්බන්ධයෙන් චෝදනා ලද අය සතුවේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ,වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශණයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්,ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශණ පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි.,තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද මුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශණවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධින් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව ඇගයීම.

  මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකියයුතු අඩුපාඩු ද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලන චෝදනා ඇති අය සමඟ මම සන්නිවේදනය කරමි.

## 2 භෞතික ප්‍රගතිය

## 2.1 කොන්ත්‍රාත් පරිපාලනය.

| | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමණාකාරීත්වයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය අරමුණ වනුයේ වත්කම් කළමනාකරණය සහ සැලසුම් සකස් කිරිම, නිර්මාණය සහ නඩත්තු කිරීමේ ක්‍රියාවන් මාර්ග කොන්ත්‍රාත්තු කළමණාකරන මූල ධර්මයන් අනුව සිදුකිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතාවය ශක්තිමත් කිරීමයි. ඒ හේතුවෙන් නියමු ව්‍යාපෘතියක් ලෙසින් පෑලියගොඩ - පුත්තලම් මාර්ගයේ ජාඇල සිට හලාවත කොටස ක්‍රියාත්මක කරන ලදී. නමුත් කැබිනට් මණ්ඩලය විසින් ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් කිරීමට 2018 අගෝස්තු 15 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමෙන් පසු තිරණය කර ඇතත්, 2018 දෙසැම්බර් 31 දින දක්වා කාලයට අදාලව ඉඩම් අත්පත්කර ගැනිම්, ඉඩම් මැනීම් කටයුතු, වැඩ සැලසුම්කරණය සහ අනෙකුත් මෙහෙයුම් වියදම් සඳහා රු.මිලියන 91.23 දැරීමෙන්ද පසුවය. නමුත් ඉහත ව්‍යාපෘතියට අදාල විස්තරාත්මක කාර්ය සැලැස්ම 2018 දෙසැම්බර් 31 දින වන විටත් සකස් කර හෝ ණය ලබාදීමේ | ජාඇල, හලාවත මාර්ග සංවර්ධන ක්‍රියාවලියේ මූලික අදියරෙහි කර්තවයයන් සඳහා දරන ලද රු.මිලියන 91.23 මුදල ව්‍යාපෘතියකට අදාල කොන්ත්‍රාත්තුවේ අත්හැරීම නිසා සහ 2018 අගෝස්තු 15 වන දින සිදු කරන ලද විෂය පථයේ ප්‍රතිව්‍යූහගත කිරීමත් සමඟ ඵලදායී නොවන බවට පත් වී ඇත. | විගණන වාර්තාවේ දත්ත සමග එකඟ වීමට හැකිය. | ව්‍යාපෘතියේ පාඩුව අවම කිරීමට අදාල පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ආයතනයේ එකඟතාවය ලබා ගෙන නොතිබුණි. එමෙන්ම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගමනය මැන බැලීමට හැකිවන පරිදි කිසිදු වාර්තාවක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් නඩත්තු කර නොතිබුණි. | | | |
| (ආ) | ලැබී ඇති වාර්තා ප්‍රකාරව ණය ගිවිසුම යටතේ ලැබුණු එ.ජ ඩොලර් මිලියන 125 (වි.ගැ.හි 90.5 මිලියන) එනම් රු. මිලියන 18,125 අතරින් එ.ජ.ඩොලර් 100 ප්‍රමාණය එනම් රු මිලියන 14,500 ක ප්‍රමාණයක් පළාත් මාර්ග වැඩි දියුණු කිරීමේ අරමුණ වෙනුවෙන් පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය වෙත පසුව මාරු කර තිබුණි. ඉතිරි මුදලින් එ.ජ.ඩොලර් මිලියන 15 ක් එනම් රු. මිලියන 2,175 ක් ව්‍යාපෘතියේ ඉදිරි වැඩ කටයුතු අඛණ්ඩව සිදුකරගෙන යාමට සහ ඉතිරි එ.ජ.ඩොලර් මිලියන 8.5 ක් එනම් රු. මිලියන 1,232.50 ක් මාර්ග නඩත්තු භාර අරමුදල වෙත පවරා දී ඇත.ව්‍යාපෘතිය 2016 ජූනි 30 වන දින ආරම්භ වී ඇතත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් රු. මිලියන 96.97 ක ප්‍රමාණයක් පමණක් ප්‍රයෝජනයට ගෙන ඇති බව පෙනී යයි. | ව්‍යාපෘතියේ සිදුකරන ලද නව ප්‍රතිව්‍යුහගත කිරීම් හේතුවෙන්, ව්‍යාපෘති කාර්යයන්හි වටිනාකම රු. මිලියන 18,125 සිට රු. මිලියන 2,175 දක්වා අඩුවී ඇත. | විගණන වාර්තාවේ දත්ත සමග එකඟ වීමට හැකිය. | සමස්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම හා ව්‍යාපෘතියේ සේවක පිරිස යන දෑ සඳහා ව්‍යාපෘතියේ නව විෂය පථයට අනුකූලව අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 ජනවාරි 11 දින ණය ලබාදීමේ කාර්යාංශය විසින් ආරම්භක මුදල ලෙසින් ලබාදුන් මිලියන 236.13 ක ප්‍රමාණයෙන් රු.මිලියන 16.58 පමණක් ප්‍රයෝජනයට ගෙන ඇත. ඉතිරි මුදල ලෙසින් රු.මිලියන 252.14 ප්‍රමාණයක් ව්‍යාපෘතිය වෙනුවෙන් මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන විශේෂ ඩොලර් ගිණුමක තැන්පත් කිරීමට කටයුතු කොට ඇත. | ඉහත රු. මිලියන 252.14 ප්‍රමාණයම වසරක් පුරාවටම අකර්මන්‍ය ලෙසින් පැවති ඇත. | රු. මිලියන 236.16 ව්‍යාපෘතියේ විෂය පථය ප්‍රතිව්‍යුහගත කිරිමට පෙරාතුව ලබාගෙන ඇත. | ව්‍යාපෘතියේ කාර්යයන් නියමිත ලෙසින් සැලසුම් කල යුතු වන අතර එය අරමුදල් ප්‍රයෝජනයට ගැනිමේ කාර්යක්ෂමතාවය වර්ධනය වන ලෙසින් සැලසුම් කල යුතුය. |